# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/60 – 2022 ඔක්තෝබර් 15 වැනි සෙනසුරාදා – 2022.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2016/134.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2021.04.23 දිනැති හා අංක 2224/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.04.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් 1. අඟුරුවාතොට, කනන්විල, රත්නාගොඩ, අංක 175/ඒ හි පදිංචි ජී. ජී. එම්. කරුණාරත්න මිය, 2. පෝරුවදණ්ඩ, මාපුටුගල, ගර්ටන් වත්ත හි පදිංචි එල්. එල්. ඩී. ලියන්වල මිය සහ කොළඹ 02, වොක්ෂෝල් පටුමඟ, අංක 55/75 හි පිහිටි ජනතා වතු සංවර්ධන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.08.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 37788 – 25 (2022/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය.

ජී. ජී. එම්. කරුණාරත්න මිය,
අංක 175/ඒ,
රත්නාගොඩ,
කනන්විල,
අඟුරුවාතොට.

එල්. එල්. ඩී. ලියන්විල මිය,
ගාර්ටන් වත්ත,
මාපුටුගල,
පෝරුවදණ්ඩ.

පළමු පාර්ශ්වය සහ

*නඩු අංකය:* ඒ/41/2021.
IR/COM/04/2016/134.

ජනතා වතු සංවර්ධන මණ්ඩලය,
අංක 55/75,
වොක්ෂෝල් පටුමග,
කොළඹ 02.

දෙවන පාර්ශ්වය

අතර පවතින කාර්මික ආරාවුල

පෙනී සිටීම.

පළමු පාර්ශ්වය වෙනුවෙන් - 01. ජී. ජී. කරුණාරත්න මිය,
02. එල්. එල්. ඩී. ලියන්වල මිය,
03. නීතීඥ රොහානි අබේගුණවර්ධන මිය.
(එක් දිනක් පමණි)

දෙවන පාර්ශ්වය වෙනුවෙන් - 01. ආර්. පී. යූ. ආර්. සිරිවර්ධන මයා

## ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ආරවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ,

“ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවය කරන ජී. ජී. එම්. කරුණාරත්න මිය සහ එල්. එල්. ඩී. ලියන්වල මිය යන දෙදෙනා හට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අනුව වැටුප් පරිවර්තනය කිරීමේ දී යම් අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.’’

ප්‍රථමවරට මෙම නඩුව විභාග කිරීම සඳහා 2022.01.11 වැනි දින කැඳවූ අතර එදිනවන විට තම ප්‍රකාශ භාර දී තිබුණේ පළමු පාර්ශවය පමණි. විස්තර ප්‍රකාශ ලබා දීම සඳහා එදින දෙවන පාර්ශවයට සති දෙකක කාලයක් ලබා දෙන ලදී. මෙම කිසිදු පාර්ශවයක්

වෙනුවෙන් කරුණු දැක්වීමට නීතීඥයෙකු හෝ වෙනත් නියෝජිතයෙක් හෝ සහභාගී වූයේ නැත. එබැවින් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පමණක් විභාග කටයුතු ආරම්භ කරන ලදී.

පළමු පාර්ශවයේ පළමු ඉල්ලුම්කාරිය වන ජී. ජී. එම්. කරුණාරත්න මියගේ ඉල්ලීම වනුයේ 2006 වසරේ නිකුත් කරන ලද කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ තමාට හිමි වැටුප නියමිත පරිදි පරිවර්තනය කර නොමැති බවත්, ඒ පිළිබඳව දිගින් දිගටම පාලනාධිකාරියෙන් ඉල්ලීම් කළ ද ඊට සතුටුදායක ප්‍රතිචාරයක් ලබා දී නොමැති බවත්, එබැවින් තමන්ට හිමි නියමිත වැටුප් පරිමාණය ලබා දෙන ලෙසත් ය. ඇය 1991.05.02 වැනි දින ලිපිකාරිණියක ලෙස සේවයට බැඳුණු බවත්, 1999.10.15 දින පොත් තබන්නා තනතුරට උසස්වීම් ලද බවත් කියා සිටී. කළමණාකරණ සේවා චක්‍රලේඛය අනුව කළමණාකරණ සහකාර තනතුර සඳහා එම්. ඒ. 1.1 වැටුප් පරිමාණය හිමි බවත්, පොත් තබන්නා තනතුරට අදාළ වැටුප් පරිමාණය එම්. ඒ. 2.1 බවත්, තමා පිහිටුවා ඇත්තේ එම්. ඒ. 1.1 වැටුප් පරිමාණයේ බවත් කියා සිටී. එම තනතුරට හිමි එම්. ඒ. 2.1 වැටුප් පරිමාණය ලබා නොදෙන්නේ නම් තමා වෙත පොත් තබන්නා ලෙස පවරා දී ඇති භාරදූර වගකීම් ඉවත් කර කළමණාකරණ සහකාර තනතුරෙහි නැවත පත් කරන ලෙස ඉල්ලා සිටී.

පළමු පාර්ශවයේ දෙවැනි ඉල්ලුම්කාරිය වන එල්. එල්. ඩී. ලියන්වල මියගේ ඉල්ලීම වනුයේ කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව වැටුප් පරිවර්තනය කිරීමේ දී එකම සේවා කාලයක් ඇති VIII වන ශ්‍රේණියේ ලිපිකරුවන්ගේ වැටුප් VII වැනි ශ්‍රේණියට උසස් කර ඇති තමන්ගේ වැටුපට වඩා වැඩි බවත් එබැවින් වැටුප් විෂමතාවයක් ඇති වී ඇති බවත්, එබැවින් තම විෂමතාවය නිවැරදි කර දෙන ලෙසත් ය.

මෙම බේරුම්කරණයට අදාළව දෙවනි පාර්ශවකරු වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය එහි කළමණාකරු මානව සම්පත් ආර්. පී. යූ. ආර්. සිරිවර්ධන මහතා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් හා මග පෙන්වීම ලබා ගැනීමට අවශ්‍ය බව ප්‍රකාශ කරමින් ඒ සඳහා මසක කාලයක් ලබා දෙන ලෙස 2021.04.28 දිනැතිව කාර්මික අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉල්ලීමක් කර ඇත. එහෙත් නඩු විභාගය ආරම්භ කරන 2022.01.11 දින වන විට ද තම විස්තර ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. එදින ද තවත් සති දෙකක් ඒ සඳහා කල් දීමට සිදු වූ අතර, ඒ වන විටත් 2022.01.10 දිනැතිව මෙම ඉල්ලීම පිළිබඳව අධ්‍යයනය කර වාර්තාවක් ලබා ගැනීමට වෙනත් නිලධාරියෙකු පත් කර ඇති බවත්, එවකට පැවති කොවිඩ් වසංගත තත්ත්වය එම කටයුතු ඉටුකර ගැනීමට බාධාවක්ව පවතින බවත් සඳහන් කරමින් තවත් මසක කාලයක් ලබා දෙන ලෙස කාර්මික අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් ඉල්ලීමක් කර ඇත.

2022.02.02 දින දෙවනවරට නඩුව කැඳවනු ලැබූ අවස්ථාවේ දී පළමු පාර්ශවයේ පළමු ඉල්ලුම්කාරිය පළමු දින නඩු විභාගයේ දී එකඟ වූ පරිදි වැටුප් සකස් කිරීමට අදාළ 2007.08.14 දිනැති ලිපිය ඉදිරිපත් කිරීමට නොහැකි බව කියාසිටී. හිඟ වැටුප් නොගෙවීමේ හේතුව මත එම ලිපිය සාමූහිකව භාර නොගත් බව කියා සිටි පළමු ඉල්ලුම්කාරිය තම දුක් ගැනවිල්ල ඉදිරිපත් කිරීමේ දී එම කරුණු තහවුරු කිරීම සඳහා කිසිදු ලේඛනමය හෝ පුද්ගල සාක්ෂි කිසිවක් ඉදිරිපත් නොකරයි. පළමු පාර්ශවයේ දෙවන ඉල්ලුම්කාරිය ද එම ගැටළුව තහවුරු කිරීම සඳහා කිසිඳු ලේඛනමය හෝ පුද්ගල සාක්ෂි කිසිවක් ඉදිරිපත් නොකරයි. අධිකරණයට ඉදිරිපත්වන කරුණු තහවුරු කර ගැනීමකින් තොරව විනිශ්චයන් දීමට කාර්මික අධිකරණයට හැකියාවක් නොමැත.

දෙවනවර නඩුව කැඳවනු ලැබූ අවස්ථාවේ දී දෙවන පාර්ශවය විසින් ද කිසිඳු සාක්ෂි ඉදිරිපත් කිරීමක් සිදු නොකරනු ලබන අතර, පළමු පාර්ශවයේ ද එකඟතාවය ඇතිව සති දෙකක් තුළ සමථයකට ඒමට කටයුතු කරන ලෙස ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් උපදෙස් දී ඇති බව කියා සිටී. ඒ අනුව සමථයකට පැමිණෙන්නේ නම් ඒ අනුව කටයුතු කර සමථ තීරණය අධිකරණයට වාර්තා කරන ලෙස දෙවන පාර්ශවයට දන්වන ලදී.

තෙවනවර නඩුව කැඳවීමේදී ද දෙපාර්ශවය සමථයකට පැමිණි නොසිටි අතර, දෙපාර්ශවයේම හිඟ වැටුප් සකස් කර ඇති බවත්, එහි නිවැරදිභාවය පරීක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයට භාර දී ඇති බවත් දෙවන පාර්ශවය විසින් දන්වන ලදී. ඒ අනුව එම වාර්තාව දින 14ට පෙර ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.

සිව්වනවරට, එනම් අවසන්වරට මෙම නඩුව 2022.04.27 දින කැඳවන ලදී. එදින සියලු පාර්ශවයන් පැමිණ සිටින ලදී. මීට පෙර නඩු විභාගයේ දී දෙවන පාර්ශවය එකඟ වූ පරිදි සමථකරණයක් හෝ හිඟ වැටුප් ගණනය කිරීමේ වාර්තාවක් හෝ අධිකරණයට ඉදිරිපත් කර නොමැත. මේ අතර පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් දෙදෙනා තවදුරටත් නඩුව කල් නොදමන ලෙසත්, නඩු කටයුතු අවසන් කරන ලෙසත් ඉල්ලා සිටී. ඒ අනුව හිඟ මුදල් ගණනය කිරීම් 2022.05.10 ට පෙර අධිකරණයට ඉදිරිපත් කරන ලෙස දෙවන පාර්ශවයට දන්වමින් සහ ලිඛිත ඉදිරිපත් කිරීම් සිදු කරන්නේ නම් ඉහත දිනට පෙර ඉදිරිපත් කරන ලෙස සියලු පාර්ශවයන්ට දන්වමින් නඩු කාර්ය අවසන් කරන ලදී.

### නිගමනය

පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු සිටින අතර එම දෙදෙනාගේ ඉල්ලීම් කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව වැටුප් පරිවර්තනය කිරීමේ දී සිදු වූ විෂමතාවයන් පිළිබඳ එකිනෙකට වෙනස් වූ ඉල්ලීම් දෙකකි. එබැවින් ඉල්ලුම්කරුවන් දෙදෙනාට අදාළව වෙන් වෙන් වූ නිගමනයක් පහත දක්වමි.

කළමණාකරණ සේවා චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීමේ දී ඉන් ආවරණයවන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි කාර්යය මණ්ඩල අනුමත කිරීම සහ වැටුප් ගෙවීම් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව සිදු කළ යුතුයි. ඒ අනුව මෙහි පළමු පාර්ශවයේ පළමු ඉල්ලුම්කාරිය ඉල්ලා සිටින පරිදි ඇයට පොත් තබන්නා ලෙස එම්. ඒ. වැටුප් ක්‍රමය අදාළ කිරීමට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුයි. මෙම ගැටලුව පිළිබඳව ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් 2018.01.11 දිනැතිව සහ 2019.05.07 දිනැතිව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ඉල්ලා ඇත. දැනට මෙම නිලධාරිණිය පොත් තබන්නා තනතුර ලෙස කළමණාකරණ සේවා චක්‍රලේඛ 25 හි VII ශ්‍රේණිය සඳහා එම්.ඒ. 1.1 නව කාණ්ඩගත වැටුප් පනතේ 15 වන පියවරේ පිහිටුවීමට උපදෙස් ලබා දී ඇත. මෙය එම්.ඒ 2.1 ලෙස ප්‍රතිව්‍යුහගත කරන්නේ නම් ඊට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු ය. මේ සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලය දැනටමත් කටයුතු කර ඇති බැවින් සහ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව වැටුප් පරිවර්තනය කර ඇති බැවින් වැටුප් පරිවර්තනය කිරීමේ දී අසාධාරණයක් සිදු වී ඇති බවට නිගමනය කළ නොහැකි ය.

පළමු පාර්ශවයේ දෙවන ඉල්ලුම්කාරියවන එල්. එල්. ඩී. ලියන්වල මිය ඉල්ලා සිටින්නේ කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව වැටුප් පරිවර්තනය කිරීමේ දී ලිපිකරු සේවයේ VII ශ්‍රේණියේ සිටින තමන්ට වඩා වැඩි වැටුපක් ලිපිකරු සේවයේ VIII ශ්‍රේණියේ සිටින අයට ලැබෙන බැවින් විෂමතාවයක් ඇති වී ඇති බවත්, එය ඉවත් කර දෙන ලෙසත් ය. මැය නඩු විභාගයේ කිසිඳු අවස්ථාවක මේ බව සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත. වැඩි වැටුපක් ගෙවනු ලබනවා යැයි කියන අයෙකුගේ වැටුප් පරිවර්තනය සමග සන්සන්දනය කිරීමකින් තොරව මෙම කරුණෙහි සනාථභාවය තහවුරු කර ගැනීමට කාර්මික අධිකරණයට හැකියාවක් නොමැත. මේ පිළිබඳව දෙවන පාර්ශවය විසින් ලිඛිත ඉදිරිපත් කිරීම් ලෙස ඉදිරිපත් කර ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් මෙම විෂමතාවයන් අධ්‍යයනය කිරීම සඳහා පත් කරන ලද බාහිර නිලධාරියෙකුගේ වාර්ථාවෙන් ද පෙන්වා දී ඇත්තේ එවැනි විෂමතාවයක් ඇති වී නොමැති බවයි. එහි සඳහන්, VII වැනි ශ්‍රේණියේ සිටි ලිපිකරුවන් VII වැනි ශ්‍රේණියේ සිටි තමාට වඩා වැඩි වැටුපක් ලබා ගන්නා බව ලියන්වල මිය ප්‍රකාශ කර සිටියත්, කළමණාකරණ සේවා චක්‍රලේඛ 30 යටතේ වැටුප් ප්‍රතිශෝධනය කිරීමේ දී VII වැනි ශ්‍රේණියේ ලිපිකරුවන්ට ලබා දී ඇත්තේ එම්. ඒ. 1.1 වැටුප් කාණ්ඩයවන අතර, VIII වැනි ශ්‍රේණියේ ලිපිකරුවන් 10 වන පියවරේත්, VII වැනි ශ්‍රේණියේ ලිපිකරුවන් 15 වන පියවරේත් තබා ඇති නිසා, එවැනි විෂමතාවයක් ඇති විය නොහැකි බව දක්වා ඇත. අසාධාරණයක් වී නොමැති බවට නිගමනය කරමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සහතික කරමි.

**ජේ. ඒ. රංජිත්,**
බේරුම්කරු.

2022 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 – 0132

---

මගේ අංකය: IR/COM/02/2017/82.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.12.30 දිනැති හා අංක 2208/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 02, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, අංක 457 හි පිහිටි සමස්ත ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය සහ 1. කොළඹ 02, පාර්ක් වීදිය, අංක 33, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, 12 වන මහල හි පිහිටි ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2. කිරිල්ලවල, නුවර පාර, අංක 333 ඒ හි පිහිටි වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (පුද්ගලික) සමාගම අතර, පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී**
**බේරුම්කරු එම්. එම්. විජිත පීරිස් මැතිතුමා ඉදිරියේ දීය.**

*පළමු පාර්ශවය වශයෙන් -*

සමස්ත ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය,
අංක 457,
ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත,
කොළඹ 02.

බේරුම්කරණ අංකය: A 79/2020.

සහ

*දෙවන පාර්ශවය වශයෙන් -*

ගොනු අංකය: IR/COM/02/2017/82.

1. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
12 වන මහල,
පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල,
අංක 33, පාර්ක් වීදිය,
කොළඹ 02.

2. වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (පුද්ගලික) සමාගම,
අංක 333 ඒ, නුවර පාර,
කිරිල්ලවල.

අතර පවත්නා කාර්මික ආරවුල

පෙනී සිටීම -

*පළමු පාර්ශවය වශයෙන්* - නියෝජිත එච්. ඒ. පියදාස මහතා
*දෙවන පාර්ශවය වශයෙන්*
*(පළමු වගඋත්තරකරු)* - නීතිඥ නදීකා කුලරත්න මහත්මිය සමග
උදාර තිලකවර්ධන මහතා
නියෝජිත හර්ෂණ වීදාගම මහතා

(දෙවන වගඋත්තරකරු) - නීතිඥ කේ. බී. සමන් ප්‍රියලාල් මහතා
නියෝජිත අයේෂා ජයතිස්ස මහත්මිය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ අංක 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ:

(i) සේවකයන්ට ප්‍රසාද දීමනා ගෙවීමේ දී වැඩ කරන දින ගණන නිවැරදිව පදනම් කරගෙන හා අනුමත නිවාඩු දින ඇතුළත්ව ප්‍රසාද දීමනා නොගෙවීම.

(ii) 2016 වර්ෂයට වැටුප 30% කින් වැඩි කිරීම යන ඉල්ලීම් සේව්‍යයා විසින් ඉටු නොකිරීම සහ

(iii) සේවකයන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමේ දී පොදු ක්‍රමයක් අනුගමනය නොකර ගොවිපළවලට අනුයුක්ත විවිධ නිලධාරීන් විසින් සේවකයන් සම්බන්ධ විනය ක්‍රියාමාර්ග ගැනීමෙන් සේවකයන්හට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් මොනවා ද? යන්න පිළිබඳව වේ.

බේරුම්කරුගේ නියෝගය පරිදි දෙපාර්ශවය විසින් සිය ප්‍රකාශන හා ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ සියල්ල සළකා බලා සහ ඉදිරිපත් කළ වාචික සැලකිරීම් සළකා බලා පාර්ශවකරුවන් අතර යම් සමථයක් ඇත්නම් ඒ පිළිබඳව දැනුම් දෙන ලෙසටත් නියෝග කරන ලදී.

ඒ අනුව වර්ෂ 2022.02.15 දින මෙම බේරුම්කරණ නඩුව කැඳවූ අවස්ථාවේ දී සමස්ත ලංකා වෙළෙඳ හා කම්කරු සංගමය (ඉල්ලුම්කාර පාර්ශවය) වෙනුවෙන් පෙනී සිටි එහි ලේකම් වන නියෝජිත එච්. ඒ. පියදාස මහතා තම ඉල්ලීම් සනාථ කරමින් වාචික කරුණු දැක්වීමක් කරන ලදී.

එකී වාචික කරුණු දැක්වීමේ දී මෙම බේරුම්කරණය සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් තුන අතරින් පළමු ඉල්ලීම වන සේවකයන්ට ප්‍රසාද දීමනා ගෙවීමේ දී වැඩ කරන දින ගණන නිවැරදිව පදනම් කරගෙන හා අනුමත නිවාඩු දින ඇතුළත්ව ප්‍රසාද දීමනා ගෙවීමට කටයුතු කරදෙන ලෙස හා දෙවන ඉල්ලීම වශයෙන් 2016 වර්ෂයට වැටුප 30%කින් වැඩි කිරීම යන ඉල්ලීම් ඉදිරියේ දී වෙනත් පාර්ශවයකට මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇති අයිතියට අයුක්තියක් නොවන පරිදි මෙම ඉල්ලීම් ඉල්ලා අස්කර ගැනීමට එකඟතාවය පළ කරන ලදී.

එසේ ම, තුන්වන ඉල්ලීම සම්බන්ධයෙන් ද කරන ලද වාචික සැලකිරීම් අනුව සේවකයන්ගේ විනය සම්බන්ධ ගැටලුව ප්‍රධාන කාර්යාලයේ දී සිදුකරන බවට වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් (පුද්ගලික) සමාගමට දැනුම් දී ඇති බැවින් හා ඩෝල් ලංකා සමාගම ඊට මැදිහත් නොවන බවටත් ප්‍රකාශ කර ඇති බව සඳහන් කරන ලදී.

ඒ අනුව සේවකයන්ගේ විනය සම්බන්ධයෙන් වන කටයුතු වලදී ද යම් සමථයක් ඇති කරගැනීමට හැකියාව ඇති බවට ද වැඩිදුරටත් කරුණු දක්වන ලදී.

කෙසේ වෙතත්, දෙවන පාර්ශවයේ පළමු වගඋත්තරකරු ඩෝල් ලංකා සමාගම වෙනුවෙන් ඉහත කී තුන්වන ඉල්ලීම සම්බන්ධව සාකච්ඡා කර තම ජ්‍යෙෂ්ඨ නීතිඥ මහතා මගින් කරුණු ඉදිරිපත් කිරීමට ඉදිරි දිනයක දී හැකි බවට කළ ඉල්ලීම අනුව වැඩිදුර විභාගයට නියම කරන ලදී.

අනතුරුව මෙම බේරුම්කරණය විභාග කිරීම සඳහා වර්ෂ 2022.08.15 දින කැඳවූ අවස්ථාවේ දී පාර්ශවකරුවන්ගේ නීතිඥයින් හා නියෝජිතවරුන් පෙනී සිටිමින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරන ලදී. එකී කරුණු දැක්වීම් මගින් පාර්ශවයන් එකඟතාවයකට පැමිණි අතර, ඒ අනුව සේවකයන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමේ දී වීරසිංහ මැන්පවර් ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ නිලධාරියෙක් අදාළ ස්ථානයට ගොස් කටයුතු කර ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නේ නම් ඊට විරුද්ධ නොවන බව ය.

ඊට පිළිතුරු ලෙස දෙවන පාර්ශවයේ පළමු වගඋත්තරකරු වෙනුවෙන් ප්‍රකාශ කරන්නට යෙදුණේ ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය නියෝජනය කරන සේවායෝජකත්වය ප්‍රතික්ෂේප කරන බවත්, ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය හා දෙවන වගඋත්තරකාර වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් ආයතනය අතර ඇතිවන එකඟතාවන්ට විරුද්ධ නොවන බවත් ය.

දෙවන වගඋත්තරකාර වීරසිංහ මැන්පවර් සප්ලයර්ස් පුද්ගලික සමාගම වෙනුවෙන් කරුණු දක්වමින් කියා සිටියේ විනය ප්‍රශ්නවල දී අදාළ ගොවිපළට ගොස් ඊට සම්බන්ධ පාර්ශවකරුවන්ගෙන් හා අනෙක් පාර්ශවයන්ගෙන් ප්‍රකාශ ලබාගෙන ප්‍රධාන කාර්යාලයේ දී ඉදිරි පියවර ගන්නා බවයි. ඉදිරියටත් එලෙස කටයුතු කළහැකි බවත්, විනය පරීක්ෂණ සම්බන්ධ පූර්ණ අයිතිය දෙවන වගඋත්තරකාර පාර්ශවයට ඇති බවත්, වෘත්තීය සමිතියකට හෝ අන් ආකාරයකට මැදිහත් වීමට වෙනත් කිසිවෙකුට නොහැකි බවටත් ප්‍රකාශ කරන ලද අතර, සාධාරණ හා යුක්ති සහගත විනය ක්‍රියාමාර්ග ගැනීමේ ක්‍රියාවලියේ අයිතිය දෙවන වගඋත්තරකරු රඳවා තබාගන්නා බවත්, යම් ආකාරයකට සාධාරණ හා යුක්ති සහගත බවින් තොරව කටයුතු කරන්නේ නම් ඊට විරුද්ධ ක්‍රියාමාර්ග ගැනීමට හැකි බවට ද වැඩිදුරටත් කරුණු දක්වන ලදී. ඒ අනුව, ඉල්ලුම්කාර පාර්ශවයේ හා වගඋත්තරකාර පාර්ශවයේ දෙවන වගඋත්තරකරු අතර ඉහත කී තුන්වන කාරණයට සේවකයන්ගේ විනය පරීක්ෂණ කටයුතු කිරීමේ දී අදාළ ගොවිපළවල් තුළ දී සිදුකිරීමටත්, ප්‍රධාන කාර්යාලයෙන් නියෝග නිකුත් කිරීමටත් එකඟතාවය පළ කරමින් සමථයක් ඇති කර ගැනීමටත් එකී කාරණය සම්බන්ධයෙන් දෙවන පාර්ශවයේ පළමුවන වගඋත්තරකරුගේ අදාළත්වයක් නොමැති බවට ද සියලු පාර්ශවයන් එකඟවීම නිසා මෙම ආරවුල සමථයකට පත්කර ගන්නා ලෙසට දැනුම් දෙන ලදී.

## ප්‍රදානය

මෙම බේරුම්කරණ නඩුවට අදාළව පළමු පාර්ශවකාර සමස්ත ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය විසින් ඉදිරිපත් කර ලද හා කම්කරු කොමසාරිස්වරයා විසින් මා වෙත යොමු කරන ලද ඉල්ලීම් තුන අතරින් පළමු හා දෙවන ඉල්ලීම් වන සංගමයේ සේවකයන්ට ප්‍රසාද දීමනා ගෙවීමේ දී වැඩ කරන දින ගණන නිවැරදිව පදනම් කරගෙන හා අනුමත නිවාඩු දින ඇතුළත්ව ප්‍රසාද දීමනා නොගෙවීම යන ඉල්ලීම හා 2016 වර්ෂයට වැටුප 30% කින් වැඩි කිරීම යන ඉල්ලීම් ඉල්ලා අස්කර ගැනීමට මා වෙත කරන ලද ඉල්ලීම්වලට ඉඩදීමට හා තුන්වන

ඉල්ලීම වන සංගමයේ සේවකයන්ගේ විනය පරීක්ෂණ කටයුතු අදාළ ගොවිපළවල දී සිදුකර දෙවන පාර්ශවයේ දෙවන වගඋත්තරකරුවන් ප්‍රධාන කාර්යාලයේ දී තීරණ දැනුම් දීම පිළිබඳව පාර්ශවයන් විරුද්ධ නොවීම මත ඇතිකර ගත් සමථයට මාගේ අනුමැතිය ලබාදෙමින් තවදුරටත් දෙපාර්ශවය අතර ආරවුලක් නොමැති බැවින්, මෙම සමථ නියෝගය ප්‍රදානයක් ලෙස ප්‍රකාශ කර සිටිමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි.

එම්. එම්. විජිත පීරිස්,
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 20 වැනි දින.

EOG 10 – 0133

---

මගේ අංකය: IR/COM/03/2018/33.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.11.09 දිනැති හා අංක 2148/59 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.11.04 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගම්පහ, පෙතියාගොඩ, ඇහැලගහහේන, එන් 6, අංක 448 හි පදිංචි පී. සී. එස්. වීරසූරිය මිය සහ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල හි පිහිටි එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.22 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ කාර්මික බේරුම්කරණ විනිශ්චය සභාව**

**බේරුම්කරුඃ කේ. කේ. කේ. ධනපාල මැතිණිය ඉදිරියේදී ය.**

නඩු අංකය: A/109/2019.
IR/COM/03/2018/33.

පී.සී.එස්.වීරසූරිය,
අංක 448, එන් 6,
ඇහැලගහහේන,
පෙතියාගොඩ,
ගම්පහ.

පළමු පාර්ශවය

සහ

එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන්,
සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල,
කටුනායක.

*දෙවැනි පාර්ශවය*

## අතර පවත්නා කාර්මික ආරාවුල

පෙනී සිටීමඃ-

| | |
|---|---|
| පළමු පාර්ශවය වෙනුවෙන් | - නීතිඥ ජානක අධිකාරි මහතා |
| දෙවැනි පාර්ශවය වෙනුවෙන් | - නීතිඥ හර්ෂණී සුධාරිකා මහත්මිය ද, ආයතනය නියෝජනය කරමින් වාසනා හතුරුසිංහ මහත්මිය සහ කළමනාකරණ නිලධාරී පී. ආර්. ඩබ්ලිව්. ඇලපාත මහතා |

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිසංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත් කර මා වෙත යොමු කර ඇත.

ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් හි සේවය කර ඇති පී. සී. එස්. වීරසූරිය මහත්මියට ශ්‍රේණිගත උසස්වීම් ලබාදීමේ දී අසාධාරණයක් සිදු වී තිබේ ද? අසාධාරණයක් සිදුවී තිබේ නම් හිමිවිය යුතු සහන කවරේ ද? " යන්න පිළිබඳව වේ.

*ආරාවුලට අදාළ පසුබිම*

මෙම ආරාවුලේ ඉල්ලුම්කාරිය 1993.05.03 වැනි දින කොන්ත්‍රාත් පදනම මත යාර්පෝට් ඇනඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ් සමාගමේ III ශ්‍රේණියේ (S 5- වැටුප් තලයේ) ලේකම්වරියක වශයෙන් සේවයට බැඳී ඇත. 1993 ඔක්තෝබර් මස 01 වන දින ලේකම් III ශ්‍රේණියේ ස්ථිර කර ඇත.

ඉල්ලුම්කාරිය ලේකම් II ශ්‍රේණිය උසස්වීම සඳහා ඉල්ලුම් කිරීමට නියමිතව තිබී ඇත්තේ 1995 වර්ෂයේ වුව ද වගඋත්තරකාර ආයතනය එම ලේකම් II ශ්‍රේණිය උසස්වීම සඳහා අයදුම්පත් කැඳවන අවස්ථාවේ ඉල්ලුම්කාරියට මෙම ලේකම් II ශ්‍රේණිය සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය III ශ්‍රේණියේ සතුටුදායක වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති බැවින් ඉල්ලුම්කාරියට එම උසස්වීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබී නැති අතර පසුව ඉල්ලුම්කාරිය විසින් 1996 වර්ෂයේ දී මෙම වසර දෙකක සේවා කාලය සම්පූර්ණ කර තිබීම මත උසස්වීම සඳහා ඉල්ලුම්කර ඇති අතර නමුත් ලිඛිත පරීක්ෂණයට හා ලඝු ලේඛන පරීක්ෂණයෙන් ලබා ගත යුතු අවම සමත් ලකුණ ලබා ගැනීමට නොහැකි වීම මත ඉල්ලුම්කාරිය එම ලේකම් II (S 6 - වැටුප් තලය) ශ්‍රේණියේ උසස්වීම ලබා ගැනීමට සුදුසුකම් ලබා නැත.

ඉන් අනතුරුව නැවත වරක් මෙම ලේකම් II ශ්‍රේණිය උසස්වීම සඳහා 1997 වගඋත්තරකාර ආයතනය පවත්වන ලද පරීක්ෂණයට මුහුණු දීමෙන් පසුව එම වසරේ විභාගය සමත් වීම මත 1998 වර්ෂයේ දී ලේකම් II ශ්‍රේණිය උසස් වීම ලබා ගැනීමට ඉල්ලුම්කාරියට හැකියාව ලැබී ඇත.

ඉල්ලුම්කාරිය ලේකම් I ශ්‍රේණිය උසස්වීම සඳහා 1999 වසරේ දී ඉල්ලුම් කරන ලදුව එම උසස්වීමට අදාළ විභාග සමත්වීම මත 2000. 01. 01 වන දින ලේකම් I ශ්‍රේණිය (S 7- වැටුප් තලය) උසස්වීම ලබා ගැනීමට සමත් වී ඇත.

ඉන් අනතුරුව වගඋත්තරකාර ආයතනය විසින් 2011. 08. 01 වන දින සිට ලේකම්වරුන් සඳහා නව උසස්වීම් පටිපාටියක් යෝජනා කර ඇති අතර එය අනුමත කර ගැනීමෙන් පසුව ලේකම් I ශ්‍රේණියේ සේවය කළ සේවකයින්ට, ලේකම් අධි ශ්‍රේණිය 5 දරන උසස්වීම් ලබා ගැනීමට වගඋත්තරකාර ආයතනය අවස්ථාව ලබා දී ඇති අතර ඒ අනුව මෙම ඉල්ලුම්කාරිය මෙම උසස්වීම සඳහා 2011 වර්ෂයේ දී අයදුම් කර ඇති අතර ඒ සඳහා පවත්වන ලද ලිඛිත පරීක්ෂණයට, පරිගණක පරීක්ෂණයට ඉල්ලුම්කාරිය මුහුණ දී ඇති අතර, මෙම පරීක්ෂණ දෙකෙන් ම ඉල්ලුම්කාරිය අසමත්වීම මත වාචික පරීක්ෂණය සඳහා කැඳවා නොමැත.

ඉන් අනතුරුව ඉල්ලුම්කාරිය නැවතත් ලේකම් අධි ශ්‍රේණිය 5 දරන උසස්වීම සඳහා අයදුම්පත් 2012 වසරේ දී ද, ආයතනය වෙත යොමු කරන ලදුව ආයතනය විසින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණයට, පරිගණක පරීක්ෂණයට ඉල්ලුම්කාරිය මුහුණ දී ඇති අතර, මෙම පරීක්ෂණ දෙකෙන් ම ඉල්ලුම්කාරිය අසමත්වීම මත වාචික පරීක්ෂණය සඳහා කැඳවා නොමැත.

එම උසස්වීම ඉල්ලුම්කාරියට ලබා දී නොමැතිවීම මත ඉල්ලුම්කාරියට අසාධාරණයක් වූ බව පවසමින් මීගමු කම්කරු කාර්යාලයට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර එම ආරවුල විභාග කර ඇති අතර නමුත් එම ආරවුල සමතයකට පත් වී නොමැති පසුබිමක මෙම ආරවුල බේරුම්කිරීම සඳහා බේරුම්කරණය ට යොමු කර ඇත.

ඒ අනුව,

මෙම ආරවුලට අදාළ ඉල්ලුම්කාරිය මෙම වගඋත්තරකාර ආයතනයේ 1993 මැයි මස 3 වැනි දින කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගෙන ඇති අතර ඒ බව ඉල්ලුම්කාරිය මගින් සලකුණු කර බේරුම්කරණ විනිශ්චය සභාව ඉදිරියේ සලකුණු කර ඉදිරිපත් කරන ලද $A_4$ දරන ලේඛනයෙන් සනාථ වේ.

පසුව 1993 ඔක්තෝබර් මස 01 වැනි දින ඉල්ලුම්කාරිය ලේකම් III ශ්‍රේණියේ තනතුරකට මෙම වගඋත්තරකාර ආයතනයේ ස්ථිර සේවයට බඳවාගෙන ඇත. ඒ බව ඉල්ලුම්කාරිය මගින් වගඋත්තරකාර ආයතනය විසින් සලකුණු කර ඉදිරිපත් කර ඇති $R_1$ දරන ලේඛනය මගින් ද, වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් වගඋත්තරකාර ආයතනයේ මානව සම්පත් කළමනාකරු වන කීර්ති වික්‍රමසිංහ ජයසේකර මහතා මගින් $R_{14}$ ලෙස ගරු බේරුම්කරණ විනිශ්චය සභාව ඉදිරියේ සලකුණු කර ඉදිරිපත් කර ඇති ලේඛන මගින් ද ඔප්පු වේ.

පසුව වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කාරිය මගින් සලකුණු කර ඉදිරිපත් කරන ලද $R_2$ ලෙස සලකුණු කරන ලද ආයතනයේ පැවැති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුව වගඋත්තරකාර ආයතනය මගින් 1995 වසරේ ලේකම් II ශ්‍රේණිය උසස්වීම සඳහා අයදුම්පත් කැඳවුව ද, වගඋත්තරකාර ආයතනය ඉල්ලුම්කාරිය මගින් සලකුණු කර ඉදිරිපත් කරන ලද $R_{2b}$ ලේඛනයට අනුව ලේකම් II ශ්‍රේණියේ උසස්වීම සඳහා, ලේකම් III ශ්‍රේණියේ සතුටුදායක වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු බවට තිබෙන කොන්දේසිය මත මෙම ඉල්ලුම්කාරිය ලේකම් II ශ්‍රේණියේ උසස්වීම සඳහා ඉල්ලුම් කළ ද, එම කොන්දේසිය මෙම ඉල්ලුම්කාරිය සම්පූර්ණ කර නොතිබීම මත ඒ සඳහා සුදුසුකම් ලැබී නොමැති බව වගඋත්තරකාර ආයතනය මගින් සාක්ෂි විමසන ලද අවස්ථාවේ දී ඉල්ලුම්කාරිය විසින් පිළිගෙන ඇත.

ප්‍රඃ මම මහත්මියට යෝජනා කර සිටිනවා $R_2$ ලේඛනයට අනුව මහත්මිය බඳවා ගන්නා ලද ලේකම් III ශ්‍රේණියේ සිට ලේකම් II ශ්‍රේණිය සඳහා උසස් වීම ලබා ගැනීම සඳහා මහත්මිය ලේකම් III ශ්‍රේණියේ සතුටුදායක වසර 2 ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි කියලා?

පිඃ ඔව්

ප්‍රඃ මහත්මිය ඒක පිළිගන්නව ද?

පිඃ ඔව්

ප්‍රඃ මම මහත්මියට යෝජනා කර සිටිනවා 1995 වසරේ දී වගඋත්තරකාර ආයතනය විසින් ලේකම් II ශ්‍රේණිය තනතුර සඳහා උසස්වීම් ලබා දීමට අයදුම් පත් කැඳවන අවස්ථාව වන විට මහත්මිය ලේකම් III ශ්‍රේණියේ වසර දෙකක සේවා කාලය සම්පූර්ණ කර නොතිබුණ බැවින් මහත්මියට ලේකම් II ශ්‍රේණිය සඳහා ඒ අවස්ථාවේ දී අයදුම් කිරීමට නොහැකි වූ බව?

පිඃ ඔව්

ආයතනයේ පැවැති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුව 1996 වසරේ දී ලේකම් II ශ්‍රේණිය උසස්වීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර ඉල්ලුම්කාරියට ඒ වන විට ආයතනය තුළ ලේකම් III ශ්‍රේණියේ වසර දෙකක සේවා කාලය සම්පූර්ණ කර තිබීම මත ලේකම් II ශ්‍රේණියේ උසස්වීම සඳහා ඉල්ලුම් කර ඇති අතර ඒ බව වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කාරිය මගින් සලකුණු කර ගරු බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද $R_3$, $R_{3[a]}$, $R_{3[b]}$, මගින් ඉල්ලුම්කාරිය පිළිගෙන ඇත.

ඉල්ලුම්කාරිය මෙම උසස්වීම සඳහා සුදුසුකම් නොලබන බව $R_4$, දරන ලේඛනයෙන් ද, එම උසස්වීම සඳහා පවත්වන ලද තරග විභාගය සඳහා පැවැති ලඝු ලේඛක පරීක්ෂණය අසමත් බව $R_{4[a]}$ ලෙස වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කාරිය මගින් සලකුණු කර ඉදිරිපත් කරන ලද ලේඛන මගින් ද, ඉල්ලුම්කාරිය විසින් පිළිගෙන ඇති අතර තව ද, එම උසස්වීම සඳහා සුදුසුකම් නොලබන බවට ද ආයතනය විසින් ඉල්ලුම්කාරියට දැනුම් දීමක් කළ බවද ඉල්ලුම්කාරිය පිළිගෙන ඇත.

පසුව ඉල්ලුම්කාරිය 1997/12/30 දාතමයෙන් යුතුව ලේකම් II ශ්‍රේණිය උසස්වීම සඳහා ඉල්ලුම්කර ඇති අයදුම්පත්‍රය හා ආවරණ ලිපිය $R_5$ හා $R_{5[b]}$ ලෙස සලකුණු කර වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කාරිය මගින් ගරු බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඇත. ඒ අනුව අදාළ පරීක්ෂණ සමත්වීම මත මෙම ඉල්ලුම්කාරියට වගඋත්තරකාර ආයතනය 1998/05/28 වැනි දින දරන ලේකම් II ශ්‍රේණිය උසස්වීම ප්‍රදානය කළ ලේඛනය $R_6$ ලෙස ද, එම උසස්වීම 1998/01/01 වැනි දින සිට බලාත්මක වන

බව දක්වෙන ලේඛනය $R_{6[a]}$ ලෙස ද, වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කාරිය මගින් සලකුණු කර ගරු බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කාරිය මගින් සලකුණු කර බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද $R_2$ දරන ආයතනයේ පැවති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට අනුව ඉන් අනතුරුව ඉල්ලුම්කාරිය ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබා ඇත්තේ ලේකම් I ශ්‍රේණිය උසස්වීම සඳහා වන අතර ඒ බව දක්වෙන $R_2$ දරන ලේඛනය මත සලකුණු කරන ලද $R_7$ ලෙස සලකුණු කරන ලද කොටස මගින් ඉල්ලුම්කාරීය ඒ බව පිළිගෙන ඇති අතර තව ද, වගඋත්තරකාර ආයතනය තුළ සතුටුදායක වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු බව ඉල්ලුම්කාරිය පිළිගෙන ඇති අතර සේවා කාලය සම්බන්ධයෙන් දක්වෙන කොටස $R_2$ ලෙස ද, වගඋත්තකාර ආයතනයේ පැවැති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය දක්වෙන ලේඛනය මත සලකුණු කරන ලද $R_{8[a]}$ කොටස සලකුණුකිරීම මගින් තහවුරු වේ.

මෙම උසස්වීම සඳහා ඉල්ලුම් කිරීමෙන් අනතුරුව අදාළ විභාග සමත්වීම මත ඉල්ලුම්කාරියට ලේකම් I ශ්‍රේණිය උසස්වීම ලැබී ඇති අතර එම උසස්වීම ආයතනය විසින් ප්‍රදානය කළ බව දක්වෙන 2001/08/08 වැනි දින දරන ලේඛනය $R_9$ ලෙස ද, එම පත්වීම 2000/01/01 වැනි දින සිට බලාත්මක වන බව දක්වෙන කොටස $R_{9[a]}$ වශයෙන් වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කාරිය මගින් සලකුණු කර ගරු බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඇත.

2011 වසරේ අගෝස්තු මස 01 වැනි දින හඳුන්වාදුන් නව බඳවා ගැනීමේ හා උසස්වීම් පටිපාටියට අනුව ආයතනයේ සේවය කරන ලද ලේකම් I ශ්‍රේණි සේවකයින්ට, ලේකම් අධිශ්‍රේණිය V සඳහා ඉල්ලුම් කිරීමට අවකාශ ලැබී ඇති බව පහත සඳහන් ඉල්ලුම්කාරියගේ සාක්ෂි මගින් ඉල්ලුම්කාරිය විසින්ම පිළිගෙන විනිශ්චය සභාව ඉදිරියේ ඔප්පු කර ඇත.

ප්‍රඃ මම මහත්මියට තවදුරටත් යෝජනා කර සිටිනවා 2011 වර්ෂයෙන් පසුව වගඋත්තරකාර ආයතනයේ සේවය කළ ලේකම්වරුන්ට ලේකම් I ශ්‍රේණියෙන් ඉහළට තවදුරටත් උසස්වීම් ලබා ගැනීමට හැකි වන ආකාරයට නව උසස්වීම් පටිපාටියක් හඳුන්වා දුන් බවට?

පිඃ ඔව්

ප්‍රඃ එසේම 2011 වසරේ අගෝස්තු මස 01 වැනි දින හඳුන්වා දුන් නව බඳවා ගැනීමේ පටිපාටියට අනුව මහත්මියට තවදුරටත් උසස්වීම් ලබාගැනීමේ හැකියාවක් පැවතියා ද?

පිඃ පැවතියා

ප්‍රඃ ඒ කුමන තනතුරක් සඳහා ද?

පිඃ ලේකම් අධිශ්‍රේණිය V

2011 වසරේ අගෝස්තු මස 01 වැනි දින දරන දැන්වීම මගින් $R_{17}$ ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති ආයතනයේ නව බඳවා ගැනීමේ හා උසස්වීම් පටිපාටියට අනුව 2011 සැප්තැම්බර් මස 01 වැනි දින දරන $R_{18}$ ලෙස සලකුණු කර ගරු විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද ලේකම් අධිශ්‍රේණිය V උසස්වීම සඳහා අයදුම්පත් කැඳවන ලද දැන්වීම මගින් ද, එම දැන්වීමේ $R_{18[a]}$ ලෙස සලකුණු කර ඇති අංක 5 යටතේ දක්වෙන කොටසින් ලේකම් අධිශ්‍රේණිය V තනතුර සඳහා උසස්වීම් ලබාදීමට අයදුම්පත් කැඳවා ඇති අතර, එම තනතුර සඳහා අයදුම් කිරීමට සපුරා තිබිය යුතු සුදුසුකම් දක්වෙන කොටස $R_{18[b]}$ ලෙස සලකුණු කර ගරු විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඇත.

ඒ අනුව 2011/10/24 වැනි දින ඉල්ලුම්කාරිය ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගී වී ඇති බව ඉල්ලුම්කාරිය විසින් $A_1$ ලෙස සලකුණු කර ගරු බේරුම්කරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඇති ලේඛනයෙන් ද, පරිගණක පරීක්ෂණය සඳහා පෙනී සිටින ලද බවට ගරු බේරුම්කරණ විනිශ්චය සභාව ඉදිරියේ සලකුණු කර ඉදිරිපත් කර ඇති $A_2$ දරන ලේඛනයෙන් ඔප්පුවන අතර නමුත් පසුව ඉල්ලුම්කාරිය විදේශ ගතවී ඇති බව ඉල්ලුම්කාරිය ගරු විනිශ්චය සභාවේ දී ලබාදී ඇති සාක්ෂි මගින් පෙනී යන අතර, තව ද ඉල්ලුම්කාරිය පරිගණක පරීක්ෂණයෙන් හා ලිඛිත පරීක්ෂණයෙන් අසමත් වීම මත ඉල්ලුම්කාරියව වාචික පරීක්ෂණය සඳහා ආයතනය විසින් කැඳවීමක් කර නොමැති බව ආයතනයේ මානව සම්පත් නිලධාරිතුමා විසින් දෙනු ලැබූ වාචික සාක්ෂි මගින් හා මානව සම්පත් නිලධාරිතුමා විසින් ඉදිරිපත් කර ඇති ආයතනයේ බඳවාගැනීම් හා උසස්වීම් පටිපාටිය අනුව හා $R_{20}$ දරන $AP_{177}$ ලේඛනමය සාක්ෂි මගින් ද, ඔප්පුවේ.

ඉන් අනතුරුව මෙම ඉල්ලුම්කාරිය 2012 වසරේ දී නැවත වරක් ලේකම් අධිශ්‍රේණිය V උසස්වීම සඳහා ඉල්ලුම්කර ඇත. මෙම ඉල්ලුම්කාරියව ලේකම් අධිශ්‍රේණිය V උසස්වීම සඳහා පවත්වන ලද විභාගය සඳහා 2012/11/09 වැනි දින දරන $R_{10}$ දරන කැඳවීමේ

ලිපිය ද, ඉංග්‍රීසි ලිඛිත පරීක්ෂණයට සහභාගී වී අත්සන් තබන ලද ලේඛනය $R_{11}$ ලෙස ද, පරිගණක පරීක්ෂණයට සහභාගි වී අත්සන් තබන ලද ලේඛනය $R_{12}$ ලෙස ද, ඉල්ලුම්කාරිය මගින් වගඋත්තරකාර ආයතනය විසින් බේරුම්කරණ විනිශ්චය සභාව ඉදිරියේ සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඉල්ලුම්කාරිය ඉහත සඳහන් පරීක්ෂණ දෙකෙන් අසමත් වීම මත එම අවස්ථාවේ දී ද, ලේකම් අධිශ්‍රේණිය V උසස්වීම ලබා ගැනීමට අවශ්‍ය වාචික පරීක්ෂණය සඳහා කැඳවීමක් කර නොමැති බව වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් වගඋත්තරකාර ආයතනයේ මානව සම්පත් නිලධාරි කීර්ති වික්‍රම ජයසේකර මහතාගේ වාචික සාක්ෂි මගින් හා එම නිලධාරිවරයා මගීන් වගඋත්තරකාර ආයතනය බේරුම්කරණ විනිශ්චය සභාව ඉදිරියේ සලකුණු කර ඉදිරිපත් කරන ලද $R_{22}$ දරන ලේඛනමය සාක්ෂි මගින් ද, තහවුරු වේ. තව ද ඉන් පසුව 2016/08/09 වන දින ඉල්ලුම්කාරිය විශ්‍රාම යන අවස්ථාව දක්වා අවස්ථා කිහිපයක දී මෙම උසස්වීම සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව තිබිය දී එය මගහැර ඇති බව වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් වගඋත්තරකාර ආයතනයේ මානව සම්පත් නිලධාරි කීර්ති වික්‍රම ජයසේකර මහතාගේ සාක්ෂි මගින් තවදුරටත් තහවුරු වේ.

මෙම ආරවුලේ ඉල්ලුම්කාරිය විසින් 2019/12/17 වැනි දින ඉදිරිපත් කර ඇති පළමු ප්‍රකාශයේ දක්වා තිබෙන ආකාරයට ඉල්ලුම්කාරියට 1995 මැයි මස 03 වැනි දින වන විට II ශ්‍රේණිය (S - 6 වැටුප්තලය) ලේකම්වරියක ලෙස උසස්වීමට අවශ්‍ය සියලුම සුදුසුකම් ලැබූවත් එම වර්ෂයේ ඒ සඳහා අවස්ථාවක් ඉල්ලුම් කිරීම ලබා නොදුන් බව ප්‍රකාශ කර ඇත.

නමුත් ඉල්ලුම්කාරිය විසින් මෙම ආරවුල විභාග වන මුල් අවස්ථාවේදීම සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර ඇත්තේ 1995 වර්ෂයේ මැයි මාසය වනවිට ඉල්ලුම්කාරියට ලේකම් II ශ්‍රේණිය (S - 6 වැටුප්තලය) සඳහා යාමට නියමිතව තිබුණ ද, 1995 වර්ෂයේ ආයතනයෙන් දැන්වීම් පළ කරන අවස්ථාව වන විට ඉල්ලුම්කාරියට වසර දෙකක සේවා කාලය සම්පූර්ණ කර නොතිබීම නිසා ඉල්ලුම්කාරියට 1995 වර්ෂයේ මෙම ලේකම් II ශ්‍රේණිය සඳහා ඉල්ලුම්කිරීමට අවකාශයක් නොතිබුණු බවයි.

තව ද, 1996 වර්ෂයේ දී ලේකම් II ශ්‍රේණිය සඳහා ඉල්ලුම් කිරීමට අවකාශ හා සුදුසුකම් තිබුණු නිසා ඉල්ලුම්කාරිය ඒ සඳහා ඉල්ලුම් කළ බවත්, ඉල්ලුම්කාරියට ලඝුලේඛනය සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට නොහැකි වීම මත ඉල්ලුම්කාරිය අදාළ උසස්වීම ලබාගැනීමට අසමත් වූ බව ද, 2019/12/17 වැනි දින බේරුම්කරන විනිශ්චය සභාවට යොමු කරන ලද ඉල්ලුම්කාරියගේ පළමු ප්‍රකාශයේ සඳහන් 3 වන ඡේදය අනුව "ලඝු ලේඛන විෂය සඳහා ගත යුතු වූ 60% ලකුණු ප්‍රමාණය 40% දක්වා අවම කොට අසමත් සියලු දෙනාටම එකී ශ්‍රේණියන් සඳහා උසස්වීම් ලබා දීමට එකල කළමනාකාරීත්වයේ අනුමැතිය ලබාගෙන එකී ලිඛිත විභාගය අසමත් වීම මත සියළු ලේකම්වරියන්ට උක්තගත ශ්‍රේණීන් ලබාදීමට කටයුතු කළ බව ඉල්ලුම්කාරිය ප්‍රකාශකර ඇත. ඒ අනුව ඇයට අසාධාරණයක් සිදු වූ බවයි."

නමුත් ඉල්ලුම්කාරිය 2021/04/09 වන දින ගරු බේරුම්කාර විනිශ්චය සභාව ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර ඇත්තේ 1996 වර්ෂයේ දී ඉල්ලුම්කාරිය නැවත ලේකම් II ශ්‍රේණිය සඳහා ඉල්ලුම් කළ බවත්, ඒ සඳහා පවත්වන ලද ලඝු ලේඛන පරීක්ෂණයෙන් සමත් ලකුණට ලඟා වීමට නොහැකි වූ නිසා ඉල්ලුම්කාරියට 1996 වර්ෂයේ දී ද, උක්ත ශ්‍රේණිගත උසස් වීම ලබා ගැනීමට නොහැකි වූ බවයි.

නමුත් ඉල්ලුම්කාරියගේ පළමු ප්‍රකාශයේ සඳහන් කර ඇති ඉහත සඳහන් පළමු වන ඡේදය අනුව ඇයට අසාධාරණයක් සිදු වූ බව ලිඛිතව සඳහන් කළ ද, එය ඉල්ලුම්කාරිය සාක්ෂි ලබා දෙන අවස්ථාවේ සාක්ෂියක් ලෙස ප්‍රකාශ කර හෝ පිළිගෙන නොමැති අතර එය ඔප්පු කිරීම සඳහා කිසිදු ලේඛනමය හෝ වාචිකමය සාක්ෂියක් ඉල්ලුම්කාරිය මගින් හෝ වෙනත් පාර්ශ්වයක සාක්ෂි මගින් හෝ ඉල්ලුම්කාරිය තම ස්ථාවරය තහවුරු කර නොමැත.

තව ද මෙම ඉල්ලුම්කාරිය මෙම ලේකම් II ශ්‍රේණිය උසස්වීම සඳහා සුදුසුකම් නොලබන බවට ඉල්ලුම්කාරියට ආයතනය විසින් බාර දෙන ලද ලිපිය $R_4$ ලෙස වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කාරිය මගින් සලකුණු කර ගරු බේරුම්කාරණ විනිශ්චය සභාවට ඉදිරිපත් කර ඇත.

නැවත වරක් වගඋත්තරකාර ආයතනය විසින් ආයතනයේ පැවැති බඳවාගැනීම් හා උසස්වීම් පරිපාටිය අනුව 1997/12/30 වැනි දින ලේකම් II ශ්‍රේණිය උසස්වීම් ලබා දීම සඳහා අයදුම්පත් කැඳවන ලද අයදුම් පත්‍රය හා ආවරණ ලිපිය $R_5$ ලෙස ද, ඉල්ලුම්කාරිය මගින් අධිකරණයේ දී සලකුණු කර ඉදිරිපත් කර ඇති අතර ඒ උසස්වීමට අදාළව ඉල්ලුම්කාරිය 1997 වර්ෂයේ දී ලේකම් II ශ්‍රේණිය සඳහා ඉල්ලුම් කළ බවත්, ඉල්ලුම්කාරිය විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය $R_{5\,(b)}$ ලෙසත් ඉල්ලුම්කාරිය මගින් වගඋත්තරකාර ආයතනය විසින් ගරු බේරුම්කරණ විනිශ්චය සභාවේ සලකුණු ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ඉල්ලුම්කාරිය අදාළ විභාග සමත්වීම මත ලේකම් II ශ්‍රේණිය සඳහා ලද උසස්වීම ලද ලේඛනය ඉල්ලුම්කාරිය මගින් වගඋත්තරකාර ආයතනය විසින් $R_6$ ලෙස සලකුණු කර බේරුම්කාර විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කර ඇත.

ඒ අනුව මෙම ඉල්ලුම්කාරිය විසින් ගරු බේරුම්කාර විනිශ්චය සභාවට ඉදිරිපත් කරන ලද පළමු වන ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ "තමා 1997 වර්ෂයේ ලේකම් II ශ්‍රේණියේ උසස්වීමට අදාළ වන විභාගය සමත් වුව ද, තමාට එය ලැබුනේ 1998 වර්ෂයේ දී බවත්, ඒ අනුව ඉල්ලුම්කාරිය වසර පහකට ආසන්න කාලයක් එකම ශ්‍රේණියේ රැඳී සිටි බවත්ය." නමුත් ගරු බේරුම්කාර විනිශ්චය සභාවට ඉල්ලුම්කාරිය මගින් ඉදිරිපත් කර ඇති සාක්ෂි මගින් තහවුරු වන්නේ එකම ශ්‍රේණියේ රැඳී සිටීමට සිදු වී ඇත්තේ

ඉල්ලුම්කාරිය ලේකම් II ශ්‍රේණිය සඳහා උසස්වීම් ලබා ගැනීමට අවශ්‍යය සුදුසුකම් සැපිරීමට අසමත් වීම මත බව ඔප්පුවන අතර මෙම ඉල්ලුම්කාරියගේ මුලු සේවා කාලය තුළම ඉල්ලුම්කාරිය විසින් ඉල්ලුම්කර ඇති උසස්වීම් සඳහා සුදුසුකම් ලබා නොමැත්තේ අදාළ උසස්වීම් සඳහා පවත්වන ලද පරීක්ෂණ අසමත්වීම මත බව බේරුම්කාර විනිශ්චය සභාව ඉදිරියේ දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කර ඇති වාචිකමය හා ලේඛනමය සාක්ෂි මගින් ඔප්පු වේ.

තව ද ආයතනය විසින් නිසි කාල සීමාවන් තුළ ආයතනික උසස්වීම් සඳහා අයදුම්පත් කැඳවා නියමිත තරග විභාග පවත්වා ඇති බව ඉදිරිපත් වී ඇති සාක්ෂි මගින් ඔප්පුවන අතර ඉල්ලුම්කාරියට කිසිදු ආකාරයක වෙනස් ආකාරයට හෝ අසාධාරණ ආකාරයෙන් සැලකුම් කර ඇති බව ඔප්පු නොවන අතර තව ද ආයතනය විසින් සේවකයන්ගේ අභිවෘද්ධිය සඳහා 2011 වසරේ දී නව උසස්වීම් පටිපාටියක් පවා හඳුන්වා දී ඇත. ඒ අනුව මෙම ආරවුලට අදාළ ඉල්ලුම්කාරියගේ සියලු උසස්වීම් සම්බන්ධයෙන් පවත්වා ඇති තරග විභාගවලට සාර්ථකව මුහුණ දීම මත හා සමත් ලකුණු ලබා ගැනීම මත ලේකම් II ශ්‍රේණිය, ලේකම් I ශ්‍රේණිය උසස්වීම් ලැබී ඇති අතර ලේකම් අධිශ්‍රේණිය V සඳහා පවත්වන ලද තරග විභාගවලින් උසස්වීම් ලබා ගැනීමට අවශ්‍ය සමත් ලකුණු ලබා ගැනීමට නොහැකි වීම මත එම උසස්වීම ලබා ගැනීමට ඉල්ලුම්කාරිය අසමත් වී ඇත. ඒ අනුව මෙම ආරවුලට අදාළව ඉල්ලුම්කාරිය ඉල්ලා සිටින සහනයන් සඳහා කිසිදු ප්‍රදානයක් ලබා දීමට බේරුම්කාර විනිශ්චය සභාව ඉදිරියේ ඉදිරිපත් වී ඇති වාචිකමය හා ලේඛනමය සාක්ෂි මගින් තහවුරු නොවන බැවින් ඉල්ලුම්කාරිය ඉල්ලා සිටින සහනයන් සඳහා කිසිදු ප්‍රදානයක් ලබා දීමට කටයුතු නොකරමි. ඒ අනුව මෙය යුක්ති සහගත හා සාධාරණ ප්‍රදානයක් බවට තීරණය කරමි.

බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 22 වැනි දින.

EOG 10-0134

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.